සබරගමු පළාත් අධ්‍යාපන  දෙපාර්තමේන්තුව

නර්තනය-10 ශ්‍රේණිය/දෙවෙනි වාරය

සැකසුම-දෙහිඕවිට කලාපය.දැරණියගල අධ්‍යාපන කොට්ඨාසය.

## වේදිකා නර්තනයට උචිත අංග රචනයක්  ගොඩනගමු


## කාර්යය පත්‍රිකාව

### ප්‍රායෝගික නර්තන අංග රචනයක් සිදු සිදු කරමු.

පියවර 1-අංගරචනයකදී අප ප්‍රධාන වශයෙන් යොදා  ගන්නේ මුහුණයි .ඇස. නළල,නහය, කම්මුල්, කට හා නිකට යන අංග විශේෂ කර දැක්විය යුතුයි.ඒ සඳහා අපි මුලින්ම කළ යුත්තේ මුහුණ වර්ණ ගන්වා ගැනීමයි.මෙයට අපි භාවිතා කරන්නේ පදනම් ආලේපනය හෙවත් පෑන් කේක් ලෙස හඳුන්වන ද්‍රව්‍යයි.එය තෙමාගත්  ස්පොන්ච්  කැබැල්ලක තවරා මුළු මුහුණ පුරා ආලේප කරමු.




පියවර 2 -   මුහුණ වර්ණ ගැන්වූවා ඉන්පසුව ඇසේ සිට අංගර රචනය ආරම්භ කරමු. යොදා ගන්නාඅමු අමුද්‍රව්‍ය -: කාජල් කූරු,අය්බ්රෝ පෙන්සිල්.මේ සඳහා කලු වර්ණය භාවිතා කරමින් අවශ්‍ය පරිදි  ඇහි බැම හැඩ ගන්නා ගත හැකිය.ඇහි බැම වර්ණ ගැන් වීමෙන් අනතුරුව ඇහැ අලංකාරය  සිදු කරමු.මේ සඳහා ඇහි බැම් පහළ කොටස තමන් කැමති ආකාරයෙන් වර්ණ එකක් හෝ කිහිපයක් යොදා වර්ණ ගැන්විය හැකිය. එය බොහෝ විට නර්තන ඇඳුම් කට්ටලය අනුව සිදුකරනවා නම් යෝග්‍යයි.අනතුරුව ඇහැ වටේ දාරය අයිලයිනර් වලින් තරමක් තද වර්ණයෙන් වර්ණ ගන්වමු.මෙය තමන්ට අවශ්‍ය හැඩයක් අනුව ඇඳ ගත හැකිය. ඇස් පිහාටු කෘතිම ඇස් පිහාටු මගින් හෝ මස්කාරා මගින් සැකසිය හැකිය.





J.A කාංචනා ජයසූරිය
කෑ/සිරිසමන් ජාතික පාසල
දැරණියගල

පියවර 3- කම්මුල් වර්ණ ගැන්වීම මින් පසුව සිදු කරමු.යොදා ගන්නා අමුද්‍රව්‍ය:බ්ලෂර්,රෝස් පව්ඩර්මෙහිදි කට මදක් උල් කර,කන දෙපස දක්වා විහිදි යන ලෙස වර්ණ ආලේප කරන්න.



<u>පියවර 4-</u> තොල් ආලේප කිරීම සිදු කරමු .තමන් කැමති වර්ණයක් මේ සඳහා භාවිතා කළ හැකිය. තොල් ආලේපනය කිරීමට පෙර ලිප් ලයිනර් එකකින් තොලේ හැඩය ඇද ගැනිම මුලින්ම සිදුකළ යුතුයි. පසුව හොඳින් තැවරෙන ලෙස වර්ණ තොලේ ආලේපනය කරන්න.



<u>පියවර 5-</u> මුහුණේ ප්‍රධාන කොටස් වර්ණ ගැන්වීමෙන් අනතුරුව ලා රෝස පැහැයෙන් නිකට, නළල, විසිරී යන ලෙස රෝස් පවුඩර් ආලේප කර මුහුණේ විධිමත් අවසානයක් පෙන්විය හැකිය.



පියවර 6-අවසානයේ නහය ත්‍රිමානණ කර පෙන්වීම සඳහා නහය උඩ සිට පහළට දාරේ දිගේ eye shadow වලින් වර්ණගන්වා අලංකාර මුහුණක් නිර්මාණය කරගත හැකිය.



**(වැඩිදුර තොරතුරු nie.com වෙබ් අඩවිය මගින් ලබ ගත හැක.)**

**J.A කාංචනා ජයසූරිය**
**කෑ/සිරිසමන් ජාතික පාසල**
**දැරණියගල**

සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නර්තනය-10 ශ්‍රේණිය/දෙවෙනි වාරය

සැකසුම-දෙහිඕවිට කලාපය.දැරණියගල අධ්‍යාපන කොට්ඨාසය.

## කාර්යය පත්‍රිකාව:

**01** .අංග රචනයක් සිදු කරන්නේ ඇයි.

**02**. නර්තනය අලංකාරයට අංගරචනය දායක වන ආකාරය විස්තර කරන්න .

**03.**මුහුණක ආකෘතියකට අංග රචනයක් සැලසුම් කරන්න.

04.උපකරණ භාවිතා කරමින් අලංකාර මුහුණක් නර්තනයට උචිත ලෙස අංග රචනය කරන්න.

**J.A** කාංචනා ජයසූරිය
කෑ/සිරිසමන් ජාතික පාසල
දැරණියගල